---

**කල්පිටිය ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2013 ජූලි 01 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 25 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, කල්පිටිය ප්‍රාදේශීය සභාවේ, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2012 දෙසැම්බර් 31 දිනට කල්පිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

සණ අපද්‍රව්‍ය ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද ගොඩනැගිලි 05ක, වටිනාකම වූ රු.5,070,362ක්ද, කන්දකුලිය පෙර පාසල් ගොඩනැගිල්ලේ වටිනාකම වූ රු.319,879ක් හා පරිත්‍යාග වශයෙන් ලද රු.72,675ක් වටිනා පොත් තොගයක් ද ස්ථාවර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) **<u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>**
2013 ඔක්තෝබර් 30 දින වන විට විගණන විමසුමකට පිළිතුරු සපයා නොතිබූ අතර, එකී විමසුමට භාජනය වූ ගනුදෙනු වල ගණනය කළහැකි වටිනාකම රු.22,486,429කි.

(ආ) **<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**
අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 64,382,512 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) **<u>ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**
එකතුව රු.1,873,603ක් වූ ගෙවීම් වවුචර් 28ක් 2013 සැප්තැම්බර් 09 දින දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,370,586ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,861,979ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය විය.

**(අ)** ගිණුම් විෂයන් 04කට අදාළ ශේෂයන්ගේ එකතුව රු.10,696,336ක් වූ අතර, එම විෂයයන්ට අදාළව පවත්වා තිබූ ලේඛනවලට අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.9,585,139ක් වූයෙන් රු.1,111,197ක වෙනසක් ගිණුම්වල දක්නට ලැබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට සභාව විසින් බාහිර පාර්ශවයන් වෙත ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.26,631,294ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.20,407,855ක් විය.

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද ගිණුම්වලට අනුව ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.22,682,973ක් වූ අතර, එයින් අවුරුදු එකක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.9,001,008ක් විය.

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.5,612,492ක් වූ අතර, අවුරුදු 01ක් ඉක්මවා ඇති ශේෂවල වටිනාකම රු.4,695,124ක් විය. එයින් මියගිය, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය සේවකයින් 58 දෙනෙකුගෙන් අවුරුදු 05කට වඩා වැඩි කාලයක් අයනොවී හිඟ හිටව පැවති ණය ශේෂ වටිනාකම රු.178,193කි.

(ඉ) 2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු එකක කාලයක් ඉක්මවා අවලව පවතින වත්කම් වල අගය රු.277,080ක් විය.

(ඊ) පහත සඳහන් බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා අතරඳවාගෙන තිබුණි.

| | | රු. |
|---|---|---|
| i. | එකතු කළ අගය මත බදු | 2,058,408 |
| ii. | ජාතිය ගොඩනැඟීමේ බදු | 30,039 |
| iii. | භාණ්ඩ හා සේවා බදු | 289,387 |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) වරිපනම් හා බදු | 6,720 | 1,602 | 5,118 |
| (ii) බදු කුලී | 12,623 | 5,343 | 7,280 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,770 | 1,611 | 159 |
| වෙනත් ආදායම් | 35,968 | 26,214 | 9,754 |

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,255,757 |
| (ii) | මුද්දර ගාස්තු | 7,498,168 |

### 2.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම 3,202,000 වූ සභා ගොඩනැඟිල්ල හා මෝටර් රථ යනාදි වත්කම් විෂයයන් 8 ක් වර්ෂ ගණනාවක සිට නිශ්කාර්යව පැවතුණි.

### 2.5 අවිධිමත් ගනුදෙනු

සභාව විසින් විවිධ කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් 1989 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සභා නිලධාරීන්ට ලබාදී තිබූ අත්තිකාරම් වටිනාකම රු.1,339,524ක් නැවත පියවා නොතිබූ අතර, එම අත්තිකාරම් අදාළ කාර්යයන් හි යෙදවීම පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.6 අක්‍රීය ගිණුම්

කල්පිටිය මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 125-1-001-1-3101645 දරණ ජංගම ගිණුමෙහි 2006 වර්ෂයේ සිට රු.98,886ක ශේෂයක් පැවති නමුත්, එම ගිණුම මඟින් මේ දක්වා කිසිදු ගනුදෙනුවක් සිදුකර නොතිබුණි.

## 2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාව සතුව අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි වාහන 06ක් සභාවේ වැඩකටයුතු සඳහා ප්‍රයෝජනයට නොගෙන ධාවනයෙන් ඉවත්කර දිරාපත්වීමට ඉඩ සලසා තිබුණි.

(ආ) සභාවට අයත් 252-6469 දරණ කැබ් රථයේ ඉන්ධන භාවිතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලීටර් 314ක් වැඩිවීමක් දක්නට ලැබුණි.

## 2.8 අභ්‍යන්තර විගණන

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) වාහන පාලනය